හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

අයියා බල්ලා බැන්ද
සුද් ලීලා බැන්ද
අපි හොරා බැඳ දැම්මා
සුද්ද ලීලා බැඳ ගත්තා
පියදස සුද්දට දු බැඳ දුන්නා

මිනිහෙක් ගෑනියක් / ගෑනියෙක් බැඳී යන වැකියේ තේරුම නිවරදිය. එහෙත් ගෑනියක් / ගෑනියෙක් මිනිහෙක් බැඳී යන වැකිය නිවැරදිද? , මගේ අදහස නම් මිනිසුන් බඳන විට ගැහැනුන් බැඳෙන බවය. පියදු ගෑනි ගෙනාවේ හංගමිං - ගුනවති දුන්නේ හුංගමට. ගුනවතී ගියේ හුංගම මිනිහෙක් එක්ක. යන වියහර අනුව ගැහැනු බැඳ දීමත් පිරිමි බැඳ ගැනීමත් නිවැරදිය. දීග තදන්නෙත් දීගෙක යන්නේත් ගැහැනුය.

ඉහත දැක්වුනු වැකකි පහේ තේරුම් එකිනෙකට වෙනස්ය. බඳී දතුව, තේරුම් දෙකක යෙදිමත් එයට 'ගන් - දෙ ඒ දම්' දතුන් එකතු කිරීමත් නිසා ය, ඒ බැඳ දැම්මා, බැඳ ගත්තා, බැඳ දුන්නා යන තුන් පලේ ඇති 'බැඳ' යන්න ආක්‍යාත දුරතයය.

'පියදස බෙල්ලේ වැල දැම්මා' යන වැකියේ පැහැදිලි තේරුමක් නැත. එහෙත් ' පියදස බෙල්ලෙ වැල ද ගත්තා යනු අර්ථවත් වාක්‍යයකි.

පියදස පිහියෙන් ඇන්නා, (ගුනපාලට)

පියදස පිහියෙන් ඇන ගත්තා යන වැකකි දෙකේ ඇත්තේ එක්ම තේරුම නොවේ.

පියදස ගුනවති බැන්ද

පියදස ගුනවතී බැඳ ගත්තා යන වැකි දෙකේ ම ඇත්තේ එක් තේරුමකි.

දෙ-ගන-ල-දම (ද) - තබ (තිය) - කර-ව-ආදි දතුන් හා එකතු වීම්සා එකිනෙකට වෙනස් තේරුම් දෙන ක්‍රියාපද කීපයක් විමසා බලමු.

අපි අපේ වත්තේ වැඩ කරනවා
අපි අපේ වත්තේ වැඩ කර ගන්නවා
අපි සීයාගේ වත්තේ වැඩ කර ගන්නාවා
අපි සීයාගේ වත්තේ වැඩ කර දෙනවා

මේ වැකකි හතරේ එකිනෙකට වෙනස් තේරුම් විමසා බලමු.

'අපි අපේ වත්තේ වැඩ කරනවා' යනු ඉතා සරල නිරවුල් වැකියකි. 'අපි - අපේ වත්තේ - වැඩ කරනවා' යනුවෙව් ඒ වැකිය තුනට කඩා ගත් විට තේරුම ගැනීම් පහසුයි

එහෙත් 'අපි අපේ වත්තේ වැඩ කර ගන්නවා ' යන්නේ තේරුම වෙනස්ය. අපි අපේ වත්තේ වැඩ අන් අය ලවා කරවා ගන්නේ නෑ යන අදහස ද එම වැකියේ හැංගී ඇත.

'අපි ම අපේ වත්තේ වැඩ කර ගන්නාව' යන වැකියේ ඇති 'ම' නිපාතය නිසා එහි අදහස තවත් ස්ථිර වේ. යන්නෙහි එබඳු වෙනසක් නැත. 'කර ගන්නවා.' යන්නෙන් ඒ අදහස කියවී ඇති නිසාය. ඒ, අනුන්ගේ වත්තක වැඩ කර දීමක් මිස වැඩ කර ගැනීමක් නැත.

'අපි සීයාගේ වත්තේ වැඩ කරනවා' අප එහි වැඩ කරන්නේ සීයාගේ උවමනාව නිසා හෝ අපේ උවමනාව නිසා විය හැකිය. එලවලු වගාවක් පටන් ගැනීම දහා අපට ද එය කල හැකිය.

'අපි සීයාගේ වත්තේ වැඩ කර දෙනවා' සීයාගේ උවමනාවට ම අප එය කරන බව කියන අදහස ඒ වැකියේ සැඟවී ඇත. ඇතැම් විට සීයාගේ බැරකම ගැන සිතා අප එය කරනවා විය හැකිය.

' මේ ලෑලි අව්වට ඇද ගහලා'
' මේ බිත්තිය ඇදයි'
'මඩුව හදන්න ඇදපු ලනු ඇද වෙලා'
' ලියන මේසේ හොල්ලා අකුරු ඇද කලා නේද?'
'මල්ලී දිව ඇදලා අක්කාට ඇද කලා'
'බල්ලා දිව ඇද ගෙන හැති ලනවා'

ඇද ගහලා (ගස) , ඇද වෙලා (ව) , ඇද කලා (කර) , ඇද ගෙන (ගන්) යන ක්‍රියා පද හැදී ඇති හැටි තේරුම් ගන්න. ඇද කරනවා, කොවොක් කරනවා, කොකා පෙන්නනවා, විරිත්තවා, නියවනවා යන පදවල එක්තරා ප්‍රමානයක සමාන කමක් ඇති බව පෙනේ.

ඌ හොඳ කෙලිං මිනිහා
කියන දේ කෙලිං කියාපං

මේ දෙවට දිගේ
කෙලි ම යන්න
කොන්ද කෙලිං
තියා ගෙන හිටපං
කොන්ද කෙලිං කර
ගෙන හිපපල්ලා
සීයා කෙලිං වෙලා
මේ කසාය බොන්න
කෙලිං කියනවා
(කියා) කෙලිං තියා
(තිය/තබ) ගන්නවා,
කෙලිං කර (කර)
ගන්නවා, කෙලිං
වෙනවා (ව)

අපේ රටේ බොහෝ නගරවල 'කෙලිං විදි' තිබී බව ඔබට මතක ඇතයි සිතමි. එක්තරා නගරයක කෙලිං වීදියේ මට වංගුවක තිබී 'දුෂියින්ට පමණයි' දැන්වීම් පුවරුවක් සහිත 'ප්‍රසිද්ධ වැසිකිලිය' මට තාම මතකය, ඉංගිරියේ Main Street සිංහලට පෙරලුනේ 'කෙලින් වීදිය' කියාය. සමහර නගරවල ඒවා පසුව 'මහ වීදි' වී

'ප්‍රසිද්ධ වැසිකිලි' සිරි ලක් බිමේ තවමත් දක්නට ඇති බව ඇසිමි. Public Lavatory **සිංහලට පෙරලුනේ 'ප්‍රසිද්ධ වැසිකිලියක්' ලෙසත්, වරද දැක දැකත් එය නිවරද කර නොගැනීම අපේ ජාති ගතියක් බව සමහරු කියති. එ හු ඔහු වේ. ඔහුට යලිත් 'හු' එකතු කොට හඳ ගත් ඔවුහු / ඔවුහු / ඔව්හු තවමත් යහතින් වැජඹෙන්නේ ඒ ගතිය නිසා දැන් නොදනිමි. කෙසේ වෙතත් වට වංගු සහිත කෙලිං විදි ඇති වෙනත් රටක් ඇද්දයි නොදනිමි.**

ඇත. 'පරසිදු මෙ මිහිතලය මදුරට පිරෙහි සාගල' යන ගීය සිහියට නංවන 'ප්‍රසිද්ධ වැසිකිලි' සිරි ලක් බිමේ තවමත් දක්නට ඇති බව ඇසිමි. Pulic Lavatory සිංහලට පෙරලුනේ 'ප්‍රසිද්ධ වැසිකිලියක්' ලෙසත්, වරද දැක දැකත් එය නිවරද කර නොගැනීම අපේ ජාති ගතියක් බව සමහරු කියති. එ හු ඔහු වේ. ඔහුට යලිත් 'හු' එකතු කොට හඳ ගත් ඔවුහු / ඔවුහු / ඔව්හු තවමත් යහතින් වැජඹෙන්නේ ඒ ගතිය නිසා දැන් නොදනිමි. කෙසේ වෙතත් වට වංගු සහිත කෙලිං විදි ඇති වෙනත් රටක් ඇද්දයි නොදනිමි.

තාත්ත : බනින කොට මං කර බා ගෙන උන්නා:

කපා ගත්ත : නං කර ගහ ගනිං
මාම : මල්ලකුත් කර තියං එනව
උඹ මගේ කරේ යන්නද හදන්නේ
දරුවත් කර පින්න ගෙන උඹ කොහේ ?
මේ පපඩං කර වෙලා වැඩියි

දෙඩන බසේ ඇහෙන මේ වැකිවල අදහස ඉතා පැහැදිලිය. දරුවා වඩා ගෙන ඔහුගේ හිස උරය මත රඳවා ගැනිම ' කර පින්නා ගැනීම' යි.

උඹ කට තියා ගෙන හිටපං
ඌ රා බොන්න මුට්ටිය කට තියා ගෙන
ඔහේදී උඹ කට රැක ගෙන ඉඳිං
උඹේ කට වැඩිය
මාත් එක්ක කට
ගහන්න නං එන්න එපා
උඹ කට කියවන්
නැතුව හිටිං
ඌ ම කට හැකර එකා
නේ
ඌ මහ කට වහ
කාරයා
මොකෝ නිකං කට
බැලිය ගෙන?
උඹ කට ගෙදර තියල
ආවාද?
උඹ කටිං ගහල
දිනන්න ද තනන්නේ ?
වහපිය කට පරයා

මේ වැකිවල ද අදහස පැහැදිලිය. අනවශ්‍ය තැනට නුසුදු කතා කියන කොනෙකුට 'කට තියාගෙන' හිටපං යනුවෙන් අවවාද කරනු ලැබේ. ගරු සරු නැතිව නොමනා ලෙෂ කතා කරන බාලයකුට 'වහපිය කට ' යනුවෙන් තර්ජනය කරනු ලැබේ. 'කට ගෙදර තියල ද ආවේ' යනුවෙන් කෙනෙකු ගෙන් අසන්නේ ඔහු මුනිවත රකින විටය.

'වැස්සි ආය බඩිං
' ඩුබාය ගිහි බඩ වෙලා
' බඩ කරලා සිරිමලා ගමෙනුත් ගිහිං
' බඩේ රුදව දැයම්මත් එක්කාව'
' මගෙ බඩ පපුව ද ගෙන ගියා
' මගේ බඩ දනවා බොලං කන්න මොනාද
' ඊයේ රෑ බඩ හැල්ලු කලාලු

අඹුදස්ස කාලේ පිරිමියකු බඩ වෙච්ච පුවතක් ඇසිමි. හරිහැටි නොදැන ඒවාට කට ලෑම අනතුරු දැයකය.

එළඹුනු නව වසර
සෝ තැවුල් බිය දුරුවී
මුලු මිනිස් වගට ම
සතුට සාමය උද වේවා

ඔබ හැම දෙනාට ම
කිරෙන් පැහියෙන් ඉතිරෙන
පැතුම් හැම ඉටු වන
වාසනා පිරි එකක් වේවා

වි ක ධර්මබන්ධු

සුභාෂිතයෙන්

රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන — තුරු
මිතුරු වේය දිගතින් හමව මඳ — මරු
මිතුරු නැසීමට එම වෙයි පම — මිතුරු
මිතුරු නෑ කෙනෙක් නිවතුන් හට — කව්රු

නිසදැස් කවිය
රුදුරු ගිනි කඳක්
ගත් සඳෙහි
දිගතින් හමන මඳ මරු
මිතරු වේය
මිතුරු නැසීමට
එය ම
පසමිතුරු වෙයි
නිවතුන් හට
මිතුරු නෑ කෙනෙක්
කව්රු ?

තේරුම : වනාන්කරයෙහි බියකරු ගින්නක් ඇති වූ විට හතර දිසාවෙන් හමන මඳ සුලඟ එයට මිතුරු (උදව්) වේ - (එහෙත්) දැල්වෙන පහනක් නිවා දැමීට ඒ (සුලඟ) ම- සතුරු (ඉවහල්) වේ (එය හරියට) දුප්පතුන්ට (දුබලයන්ට) හිතවතුන් හා නෑයන් (පිටුපෑම - වැනිය) උදව් නොකිරීම වැනිය.

කැංගුන් රටේ ඉන්නා අපට ලැව්ගනි ගැන කිව යුතු නැත. එබඳු ලැව් ගින්නක් ඇති වූ විට සුලඟ නිසා එය බලවත් වී පැතිර යයි. එද බුම්තෙල් (කෙරසින්) ලාම්පු තිබුනේ නැත. තිබුනේ (පොල්(තෙල් පහන්ය. දැල්වෙමින් තිබෙන (පොල් තෙල්) පහන ඒ සුලඟින්ම නිවී යයි. ලැව් ගින්න පොහොසතකු වැන්න. පොල් තෙල් පහන දුප්පතෙකි. ලැව් ගින්න පැතිවීමට උදව් වන සුලඟම පහන නිවීමට උදව් (හේතු) වේ.

සුලඟ නිසා පහන් නිවී යෑම දහමය. එහෙත් නෑයන් හෝ මිතුරන් පිටුපෑම නිසා දුබලයාට වන විපතක් නැත. ඔහු උන් තැනම සිටී. දිය අත දියත (ලොව) මෙන්ම වන අත වනත / වනාත වේ. ඒ තද්දිත පද දෙකකි.

දනවත් යන්නේ 'වත්' යනු ප්‍රත්‍යයකි. නිවන් යන්නේ 'වත්' යනු වස්තුවය. නිර්වස්ත්‍ර යන තේරු ම ද එහි ඇත.

'නිවන් නිවටුන්' යන්නේ ඇත්තේ නිර්වස්ත්‍ර ව සිටිනා නිගන්ටයන්ට යන තේරුමය.

මිත'රු යනු මුවදෙව්දවේත් තිසර සන්දේසයේත් 'පහන' යන තේරුම ඇතිව යෙදී ඇතත් එහි සුලමුල කිහිවක් මම නොදනිමි.

වි ක ධර්මබන්ධු

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම ආවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243